# කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

# Performance Report

## 2024

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம்
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

**Department of National Budget**
**Ministry of Finance, Planning and Economic Development**

# 2024 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය - 240

## පටුන

**1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය .......... 4**

1.1 හැඳින්වීම .......... 4

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු .......... 4

1.3 ප්‍රධාන කාර්යයන් .......... 5

1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම .......... 5

1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම .......... 5

1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු .......... 6

1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම .......... 6

1.3.5 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් රාජ්‍ය ආයතන අධීක්ෂණයට අදාළ ක්‍රියාකාරකම් .......... 6

1.3.6 වෙනත් කටයුතු .......... 7

1.4 සංවිධාන සටහන .......... 8

**2 2024 වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය හා ඉදිරි දැක්ම .......... 9**

2.1 විස්තරාත්මක කාර්ය සාධනය .......... 10

2.2 රාජ්‍ය වියදම් කළමනාකරණය .......... 16

2.2.1 අයවැය ක්‍රියාත්මක කිරීම 2024 .......... 16

2.2.2 පරිපූරක ඇස්තමේන්තු .......... 16

2.2.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වැනි වගන්තියේ (4) උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන වරෙන්තු .......... 17

2.2.4 පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර .......... 17

2.2.5 ප්‍රතිපාදන මාරු කිරීම .......... 18

2.2.6 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් අමතර ප්‍රතිපාදන ලබාදීම .......... 18

2.2.7 රජයේ වියදම .......... 18

2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු .......... 21

2.3.1 උපරිම ලැබීම් සීමාව .......... 21

2.3.2 අවම ලැබීම් සීමාව .......... 22

2.3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් “බී” ගිණුම්වල පොලී ආදායම .......... 22

2.3.4 වාණිජ, ගබඩා සහ අනෙකුත් අත්තිකාරම් ගිණුම්වල මූල්‍ය කාර්යසාධනය .......... 22

2.3.5 අත්තිකාරම් සීමා සංශෝධනය .......... 22

**3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)........................................ 23**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය........................................ 23

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය........................................ 25

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය........................................ 27

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්........................................ 29

3.4.1 **වාර්තා කිරීමේ පදනම**........................................ 29

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය -........................................ 30

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය........................................ 30

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය........................................ 30

3.8 විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් වාර්තාව........................................ 31

3.9 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති මතය........................................ 31

**4 කාර්ය සාධන දර්ශක........................................ 32**

4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2024 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ........................................ 32

**5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය........................................ 33**

**6 මානව සම්පත් පැතිකඩ........................................ 34**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය........................................ 34

6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය........................................ 34

6.3 මානව සම්පත් සංවර්ධනය........................................ 34

**7 අනුකූලතා වාර්තාව........................................ 41**

# 1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තු පනත්වල ප්‍රතිපාදන යටතේවන නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති රාමුව තුල සමස්ථ මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරයි. මෙම ක්‍රියාවලියේ දී රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ මහා භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග නිරන්තර අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වෙන් කිරීම් හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය

### මෙහෙවර

පොදු භාණ්ඩ (Public goods) සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදාහැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීමෙන් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම.

### අරමුණු

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- මූල්‍ය කම්පන වලට ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

### 1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව (Medium Term Fiscal Framework - MTFF) හා අදාල වර්ෂයේ රාජ්‍ය මූල්‍ය අවකාශය (Fiscal Space) හඳුනා ගැනීම හා අයවැය සම්පාදනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම
- වියදම් ඒකක සමඟ සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමඟ අයවැය සාකච්ඡා/උපදේශක රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ද විමසා ආදායම, වියදම, මූල්‍යකරණ (දේශීය හා විදේශීය) හා ණය ගැනීම් සීමාවන් පිළිබඳව තීරණය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම සඳහා)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට සහභාගී වීම හා අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින් ද එම අවස්ථාවට සහභාගීවන බව තහවුරු කිරීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමේ අවස්ථාවට සහභාගී වීම - කාරක සභා අවස්ථාවේ විවාදය
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

### 1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුළත්ව අදාල උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ ප්‍රකාශිත අරමුණු වෙනුවෙන්ම එම මුදල් යොදාගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා පාලන විධික්‍රම බලාත්මක කිරීම.

- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම.
- ප්‍රතිපාදන වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය අරමුණුකොට ගෙන ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන නැවත වෙන් කිරීම (reallocation) / මාරු කිරීම Transfer)
- "පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය - Supplementary Support Services and Contingent Liabilities Project"(TMV) කළමනාකරණය කිරීම

### 1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම්වල සීමා සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

### 1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

- අයවැය යෝජනා විශ්ලේෂණය කර වඩාත් සුදුසු ආයතන වෙත අදාල ප්‍රතිපාදන නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම

- අවශ්‍ය පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම

- විශේෂ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (වාහන ලීසිං / ජූලි වැඩ වර්ජක දීමනා / යතුරු පැදි ලබා දීම වැනි)

### 1.3.5 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් රාජ්‍ය ආයතන අධීක්ෂණයට අදාළ ක්‍රියාකාරකම්

- රාජ්‍ය ව්‍යවසායන් සහ ව්‍යවස්ථාපිත ආයතන 115ක් වෙත ප්‍රතිපාදන වෙන්කිරීම සහ ඒවායේ අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම
- 2003.10.28 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 17 ප්‍රකාරව එම රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ විදේශ සංචාර සඳහා වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම
- අයවැය ප්‍රතිපාදනවලින් මාසික අක්මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබාදීම
- එම රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම සහ සේවක සංඛ්‍යවේ ඇතුළත් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නිතිපතා කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ ඒවායේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීම.

### 1.3.6 වෙනත් කටයුතු

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවක් වන රාජ්‍ය මුදල් කාරක සභාවේ (Committee on Public Finance - COPF) රැස්වීම් සඳහා කැඳවූ අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන්වන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (Committee on Public Accounts - COPA) සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා (Committee on Public Enterprises - COPE) රැස්වීම් සඳහා කැඳවූ අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- වෙනත් පාර්ලිමේන්තු කාරක සභාවල දී සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවන රැස්වීම්වල දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම

- දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ කෙටුම්පත් කිරීම

## 1.4 සංවිධාන සටහන




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ.ජ. | - අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - | ගණකාධිකාරී |
| අ | - අධ්‍යක්ෂ | නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - | පරිපාලන නිලධාරී |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ | ක.සේ.නි. | - | කළමනාකරණ සේවා නිලධාරී | භා.ප. | - | භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - | සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - | කාර්යාල කාර්යය සහයක |

# 2 2024 වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වෙනත් වර්ෂ වලදී මෙන්ම 2024 වර්ෂය තුළදීද 2025 වර්ෂය සඳහා වන අයවැය සම්පාදන කටයුතු ආරම්භ කරන ලදි . ඒ අනුව 2024 දින අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිදහස් කර එවකට පැවති අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡාද පවත්වන ලදි . එසේ වුවත් 2024 සැප්තැම්බර් මස 24 දින පාර්ලිමේන්තුව විසුරා හැරීම හේතුවෙන් හා අමාත්‍ය මණ්ඩල ව්‍යුහය තාවකාලික පදනමට වෙනස් වීම හේතුවෙන් 2025 අයවැය සාකච්ඡා කටයුතු ද තාවකාලිකව අත්හිටුවන ලදි . 2024 නොවැම්බර් 21 දින අභිනව පාර්ලිමේන්තුව රැස්වූ නමුත් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාල ව්‍යවස්ථානුකූලව නියමව ඇති පියවරයන් අනුගමනය කරමින් 2024 වර්ෂයේ ඉතිරි කාලය තුළ 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමෙන්තුව සම්මත කර ගැනීමට හැකියාවක් නොතිබුණි.

එබැවින් 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23(1) 90 වගන්තිය ප්‍රකාරව 2025 වර්ෂයේ මුල් මාස 4 ක කාලයක් තුළ රජයේ වියදම් දැරීමට හැකිවන පරිදි අතුරු සම්මත ගිණුමක් පාර්ලිමෙන්තුවට ඉදිරිපත් කරන ලදි . එම අතුරු සම්මත ගිණුම 2024.12.06 දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදි .

එම ක්‍රියාවලිය අතරතුර 2025 වර්ෂය සඳහා වන අයවැය සම්පාදන කටයුතු ද සිදු කරන ලදි . අභිනව අමාත්‍යාංශ සමග සාකච්ඡා කිරීමෙන් අනතුරව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු ද ඇතුලත් කරමින් සකස් කල විසර්ජන පනත් කෙටුම්පත 2024.12.24 දින ගැසට් පත්‍රයේ පල කරන ලදි .

### පුරවැසි අයවැය

අයවැය විනිවිදභාවයේ වැදගත්කම හඳුනාගනිමින්, රජයේ අයවැය පිළිබඳ තොරතුරු මහජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි සරල, පාරිභාෂිකභාවයෙන් අඩු මෙන්ම වඩාත් මහජන හිතකාමී ආකෘතියකින් ලබා දීමේ අරමුණෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ සිට වාර්ෂිකව පුරවැසි අයවැය සකස් කරන ලදී. 2024 වර්ෂයේ අයවැය දෙවන වර කියවීමේදී, ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව වෙත මෙම ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී. වර්තමානයේ දී, 2024 අගෝස්තු 8 වන දින සම්මත කරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින්, වාර්ෂික අයවැයේ මහජන හිතකාමී අනුවාදයක් සකස් කර වාර්ෂික අයවැයට සමගාමීව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනිවාර්ය කර ඇත.









## 2.1 විස්තරාත්මක කාර්ය සාධනය

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2023 අංක 34 දරන විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය | වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2023.12.29 දිනැති අංක 05/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛය (2024 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය) නිකුත් කරන ලදී. |
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මු.රෙ. 66 සහ මු.රෙ. 69 (වීරමොං ක්‍රියාපටිපාටිය) යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සඳහා බලය ලබාදීම. | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම | ප්‍රතිපාදන මාරුකිරීම සඳහා වූ ඉල්ලීම් 1,649 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 63 ක් වැඩසටහන් අතර මාරු කිරීම සඳහා වන අතර 1,586 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් සඳහා වේ. මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 16 ක ට මු.රෙ. 69 යටතේ බලය ලබා දෙන ලදී. |
| | විසර්ජන පනතේ 6(1) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම. | වියදම් කිරීමේ ආයතනවල මනා ක්‍රියාකාරීත්වය පිණිස ඒවායේ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවන් ලබා දීම. | අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදා: වසංගත, ස්වාභාවික ආපදා) සහ වියදම් ඇස්තමේන්තුවල පැවති යම් යම් අපගමනයන් සපුරාලීම පිණිස වර්ෂය තුළ දී අතිරේක ප්‍රතිපාදන සඳහා වූ ලිපි 1,614 ක් මගින් රු. බිලියන 178 ක ප්‍රතිපාදන වැය ශීර්ෂ වෙත නැවත විසර්ජනය කරන ලදී. |
| | පරිපූරක ප්‍රතිපාදන ලබාදීම පිළිබඳව පරිපූරක ඇස්තමේන්තු මාස දෙකකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම | ලබා දුන් සියලුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 14 ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 2. 2025 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියලුම වියදම් කිරීමේ ආයතන විසින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම. | 2025 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් වූ අංක 02/2024 දරන චක්‍රලේඛය 2024.08.12 දින නිකුත් කරන ලදී. |
| | මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර රාජ්‍ය මූල්‍ය රාමුව තීරණය කිරීම. | නෛතික රාමුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරාමිතීන් තුළ රජයේ ආර්ථික සංවර්ධන අරමුණුවලට අදාළ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් ගිවිසුම පදනම් කරගනිමින් සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව රාජ්‍ය මූල්‍ය රාමුව අවසන් කරන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සහ වෙනත් වැය දරන ආයතන සමඟ අයවැය සාකච්ඡා පැවැත්වීම. | වැය දරන ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් සලකා බලා, පවත්නා රාජ්‍ය මූල්‍ය අවකාශයට ගැලපෙන පරිදි වියදම් ප්‍රමුඛතාගත කරමින්, නිසි මූල්‍ය කළමනාකරණයක් හා මූල්‍ය විනයක් සහිතව අදාළ රාජ්‍ය මූල්‍ය ඉලක්කවලට අනුකූල වන පරිදි අයවැයක් සකස් කිරීම. | 2024.09.02 දින සිට 2024.09.12 දින දක්වා සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |
| | 2024 සැප්තැම්බර් 24 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින්, ඇස්තමේන්තු සකස් කිරීමට අදාළ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. | | |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2025 සඳහා වූ අතුරු සම්මත ගිණුමෙහි කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | අතුරු සම්මත ගිණුමෙහි කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2024.11.25 දින අතුරු සම්මත ගිණුම සකස් කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමි වීම.<br><br>2024.12.02 දින නව රජයේ අමාත්‍යාංශ ව්‍යුහයට අනුකූලව සකස් කරන ලද අතුරු සම්මත ගිණුම සඳහා කැබිනට් අනුමැතිය හිමි වීම.<br><br>අතුරු සම්මත ගිණුම සඳහා වූ යෝජනාව 2024.12.05 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර 2024.12.06 දින ඊට පාර්ලිමේන්තු අනුමැතිය හිමි වීම. |
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රය නිකුත් කිරීම. | වියදම් සඳහා බලය ලබාදීම. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2024.12.11 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී. |
| | 2025 අයවැය කටයුතු නැවත ආරම්භ කිරීම.<br><br>අයවැය සාකච්ඡා නැවත පවත්වන ලදී.<br><br>2025 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | 2025 වර්ෂය සඳහා විසර්ජන පනත සඳහා අනුමැතිය ලබා ගැනීම. | අයවැය ඇස්තමේන්තු නැවත කැඳවීම සඳහා 2024.12.03 දින අංක 04/2024 දරන අයවැය කැඳවීම් චක්‍රලේඛය නිකුත් කරන ලදී.<br><br>2024.12.02 සිට 2024.12.10 දක්වා අයවැය සාකච්ඡා පවත්වන ලදී.<br><br>විසර්ජන පනත් කෙටුම්පත සඳහා 2024.12.23 දින කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.<br><br>විසර්ජන පනත් කෙටුම්පත 2024.12.27 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.<br><br>ඉතිරි කටයුතු 2025 වර්ෂයේදී සිදු කරන ලදී. |
| 3. අත්තිකාරම් ගිණුම් කටයුතු | 2023 වර්ෂය තුල සීමා | විසර්ජන පනතේ 8 වන වගන්තියට | අත්තිකාරම් “බී” ගිණුම් 26 |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | සංශෝධනය කරන ලද අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම | අනුකූලව අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳව වූ සීමා සංශෝධනයන් බලාත්මක කිරීම | ක් සහ වාණිජ අත්තිකාරම් අත්තිකාරම් ගිණුම් 5ක් 2023 වර්ෂයට අදාලව සීමා සශෝධනයන් සඳහා 2024 වර්ෂය තුළ දී යෝජනා 06 ක් යටතේ නියමයන් 31 ක් මගින් පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන ඇත. |
| | 2024 වර්ෂය සඳහා වන අත්තිකාරම් ගිණුම් කටයුතු හැසිරවීම | අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වා ගැනීම | 2023 අංක **34** දරන විසර්ජන පනතෙහි III වන උපලේඛණය |
| | | රජයේ නිලධාරීන්ට අවම පොලියක් යටතේ ණය හා අත්තිකාරම් ලබා ගැනීමට පහසුකම් සැලසීම. | සමාලෝචිත වර්ෂය තුල දී රු. මිලියන **16,114** ක ණය/අත්තිකාරම් ලබා දී ඇත.<br><br>සමාලෝචිත වර්ෂය තුල දී රු. මිලියන 1,463 ක පොලී ආදායමක් උපයා ඇත. |
| | | ගබඩා හා වෙනත් අත්තිකාරම් ගිණුම් අලාභයකින් තොරව පවත්වාගෙන යාම | සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් අලාභයකින් තොරව පවත්වාගෙන ගොස් ඇත. |
| | | වාණිජ අත්තිකාරම් ගිණුම් ලාභදායීව පවත්වාගෙන යාම | අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් 05 කින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 850 ක ලාභයක් උපයා තිබුණි. |
| | අවශ්‍යතාවය මත අත්තිකාරම් ගිණුම් සඳහා නියම කරන ලද සීමාවන් සංශෝධනය කිරීම | සීමා සංශෝධනය සඳහා ඊළඟ වර්ෂයේ මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා | සමාලෝචිත වර්ෂය තුල දී රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේ ගිණුම් 11සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා වන වාණිජ |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2025 වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් සීමාවන් නිර්ණය කිරීම | ගැනීම<br><br>අත්තිකාරම් ගිණුම් පවත්වා ගැනීම | අත්තිකාරම් ගිණුම් 09 ක සීමා සංශෝධන සිදුකර ඇත.<br><br>2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල III වැනි උපලේඛනය |
| 4. පාර්ලිමේන්තු කාරක සභා සඳහා සහාය දැක්වීම | රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාව නියෝජනය කිරීම | පාර්ලිමේන්තු කාරක සභා සඳහා කැඳවීම් ලද විට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවශ්‍ය සහභාගීත්වය ලබා දීම | කාරක සභා රැස්වීම් සඳහා කැඳවීම් සිදු කරන ලද සෑම කාරක සභා රැස්වීමක් සඳහා ම නිලධාරියෙකු/ නිලධාරීන් සහභාගී වී ඇත. |
| 5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>(අ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) මූල්‍ය ප්‍රකාශන<br><br>(ඇ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය වියදම් සමාලෝචනය පරිච්ඡේදය | නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම. | පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.<br><br>(අ) කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) මූල්‍ය ප්‍රකාශන 2023<br><br>(ඇ) වියදම් සමාලෝචනය 2023 |
| | ධාරිතා ගොඩනැංවීම | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය. | විදේශීය ආයතන විසින් දායකත්වය සපයන ලද විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 27 දෙනෙකු සහභාගී වී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අදාල වන පරිදි නිලධාරීන්ට දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම | අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවෙකුටම ණය අත්තිකාරම් ප්‍රදානය කිරීම | බලය ලබා දී ඇති සීමාවන් පිළිපදිමින් රු. 5,751,049.45 ක් වටිනා ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් ලබා දී ඇත. |
| | විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම. | විගණන විමසුම් අවම කිරීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් එවන ලද සියලුම විගණන විමසුම් (විගණන විමසුම් හයක් 06) සඳහා පිළිතුරු ලබාදෙන ලදී. |
| 6. විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැළසීම. | අවශ්‍ය අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවලට සහභාගී වීම. | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම. | අදාල අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා භෞතිකව හෝ මාර්ගගතව සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.<br><br>එමෙන්ම, දැනට ක්‍රියාත්මක කරනු ලබන සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණවලට අදාළ නව පනත් කෙටුම්පත් සම්පාදනයේ දී දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ/නිර්දේශ ලබා දෙන ලදී. |

**සේවක සුභසාධන කටයුතු**

ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 ප්‍රකාරව රජයේ අරමුදල් භාවිතා කරමින් බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කර ඇති බැවින්, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සේවා අභිප්‍රේරණය සහ සුහදතාවය වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සහ සුභසාධන සංගමයේ මූල්‍ය දායකත්වය යටතේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් කොම්පඤ්ඤවීදියේ පොලිස් ක්‍රීඩාංගණයේ පැවති අලුත් අවුරුදු උත්සවය සහ බේරුවල මොරගල්ල වෙරළ තීරයේ දර්ශන නැරඹීම සහ විනෝදාස්වාදය සඳහා සංවිධානය කරන ලද විනෝද චාරිකාව ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගත්තේය. කාර්ය මණ්ඩලය මෙම වැඩසටහන් සඳහා උද්යෝගයෙන් සහභාගී විය.

## 2.2 රාජ්‍ය වියදම් කළමනාකරණය

### 2.2.1 අයවැය ක්‍රියාත්මක කිරීම 2024

2024 වර්ෂය සඳහා වන 2023 අංක **34** දරන විසර්ජන පනත 2023.12.**13** දිනැතිව පාර්ලිමේන්තුවෙන් සම්මත විය. එම විසර්ජන පනත අනුව රජයේ සමස්ත පුනරාවර්තන වියදම රු. මිලියන **5,298,669** ක් වූ අතර, ප්‍රාග්ධන වියදම හා ණය ආපසු ගෙවීම් පිලිවෙළින් රු. මිලියන **1,709,775** ක් සහ රු. මිලියන **4,268,395** ක් විය.

පාර්ලිමේන්තුව විසින් යම් නිශ්චිත වර්ෂයක් සඳහා සම්මත කරනු ලබන සමස්ත වියදම පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන්, මුදල් අමාත්‍යවරයා විසින් පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීමෙන්, සංශෝධිත පනත් කෙටුම්පතක් ඉදිරිපත්වීමෙන් හෝ විසර්ජන පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමෙන් සංශෝධනය කළ හැක.

එලෙසින්, 2023 සඳහා වූ අයවැය වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තු **14** ක්, මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර **4** ක් හා ඊට අමතරව, වීරමොං ක්‍රියාපටිපාටිය සඳහා සහ වර්ෂය තුල ඉදිරිපත් වූ ප්‍රතිපාදන මාරු කිරීම් ඉල්ලුම් පත්‍ර **1,383** ක් අනුමත කිරීම හේතුවෙන් සම්මත අයවැයෙහි සංයුතිය පහත පරිදි සංශෝධනය විය.

- පුනරාවර්තන වියදම - රු. මිලියන **5,206,092**
- ප්‍රාග්ධන වියදම - රු. මිලියන **2,227,301**
- ණය ආපසු ගෙවීම් - රු. මිලියන **1,412,245**

ඒ අනුව, 2023 අංක **34** දරන විසර්ජන පනතේ සඳහන් සමස්ත වියදම වූ, රු මිලියන **11,276,838** වර්ෂය අවසාන වන විට රු. මිලියන **7,473,393** ක් දක්වා සංශෝධනය විය.

රාජ්‍ය සම්පත් උපරිම ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කිරීමට නිකුත් කරන ලද උපදෙස් අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය වෙනත් ආයතන, දෙපාර්තමේන්තු සහ අමාත්‍ය කාර්යාල විසින් සංවිධානය කරනු ලබන රැස්වීම්, සාකච්ඡා හා පුහුණුවීම් පැවැත්වීම සඳහා ලබා දීම තුලින් එය උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව යොදවා ගැනීමට නිසි ක්‍රමවේදයක් යටතේ ඉඩ සලස්වා දී තිබේ.

### 2.2.2 පරිපූරක ඇස්තමේන්තු

**2024** වර්ෂයේදී**,** පාර්ලිමේන්තුව විසින් අවස්ථා **02** කදී **(2024.06.19** සහ **2024.12.06** දින) පරිපූරක ඇස්තමේන්තු **14** ක් අනුමත කර ඇති අතර**,** එහි මුළු වටිනාකම රුපියල් මිලියන **241,123** කි.

වෛද්‍ය සැපයීම් සහ වෙනත් අත්‍යාවශ්‍ය බැඳීම් පියවීම සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගැනීමට රු. බිලියන 20ක පරිපූරක ඇස්තමේන්තුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ඊට සමගාමීව සෞඛය අමාත්‍යාංශයේම තෝරාගත් වැය විෂයක ප්‍රතිපාදන අවුරා තබන ලද බැවින්, සමස්ත වියදම් ඇස්තමේන්තුවට එමගින් බලපෑමක් සිදු නොවුනි.
මේ අනුව**,** 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව**,** ප්‍රාථමික වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් 13% නොඉක්මවන අනුපාතයකින් රඳවා ගැනීමේ අවශ්‍යතාවය

සැලකිල්ලට ගනිමින්, 2023 අංක 34 දරන විසර්ජන පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු හරහා ප්‍රතිපාදන සිදු කිරීමේදී එයට සමගාමීව ද සමාන ප්‍රතිපාදනයන් අවුරා තැබූ බැවින්, සමස්ත වියදම් ඇස්තමේන්තුවේ වෙනසක් සිදු නොවුනි.

### 2.2.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වැනි වගන්තියේ (4) උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන වරෙන්තු

2024.09.24 දින පාර්ලිමේන්තුව හදිසියේම විසුරුවා හරින ලද අතර 2024.11.14 දින පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට දින නියම කරන ලදී. මැතිවරණය පැවැත්වීමට පූර්වයෙන් තීරණය කර නොතිබූ හෙයින් ඒ සඳහා මුදල් වෙන් කර නොතිබිණි. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වැනි වගන්තියේ (4) උප වගන්තිය මගින් ජනාධිපතිවරයාට පවරා ඇති බලතල අනුව, ඒකාබද්ධ අරමුදලෙන් රුපියල් මිලියන 5000 ක මුදලක් නිදහස් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් 2024.09.26 දිනැති අධිකාරී බලය නිකුත් කරන ලදී.

### 2.2.4 පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛණයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබා ගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත.

ඒ අනුව, වගුවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2024 වර්ෂයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රු. බිලියන 473 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා බලපත්‍ර 04 ක් නිකුත් කර ඇත.

2.2.3 වගුව පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

| අංකය | වැය ශීර්ෂ අංකය | ආයතනය | කාර්යය/අරමුණ | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | 010 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | ඉහළ නංවන ලද පාරිශ්‍රමික, පුද්ගල පඩිනඩි තුළට ඇතුළත් කිරීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම | 12,060,000 |
| 02 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාමිකයන් සඳහා වැඩිකරන ලද ජීවන වියදම් දීමනාව සහ හිමි ගන්වන ලද අන්තර් කාලීන දීමනාව සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම | 3,400,000,000 |
| 03 | 001 | අතිගරු ජනාධිපති | 2024.09.22 දින ධූර කාලය අවසන් වීම මත හිටපු ජනපතිතුමන් හට වසරේ ඉදිරි කාලය සඳහා අවශ්‍ය විශ්‍රාම වැටුප් හා එයට අදාළ ආනුෂංගික වියදම් දැරීම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම | 318,500.00 |
| 04 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | විදේශ ණය ප්‍රතිව්‍යූහගතකරණය කිරීම හේතුවෙන් ගෙවීමට සිදු වූ විදේශ ණය හා පොලී සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම | 469,600,000,000 |

### 2.2.5 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුළ මුදල් රෙගුලාසිවල සඳහන් "වීරමොං පටිපාටිය"(Virement Procedure) යටතේ, උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට විසර්ජන පනතේ 5 වන වගන්තිය මඟින් ආයතනයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව, 2024 වර්ෂය තුළ දී රු. බිලියන 209.0 ක වටිනාකමකින් යුතු එවැනි මාරු කිරීම් 1,633 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

### 2.2.6 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් අමතර ප්‍රතිපාදන ලබාදීම

වැය දරන ආයතනයන් හි පුරෝකථනය කළ නොහැකි හදිසි හා අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා සඳහා 2024 මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති විශේෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව අතිරේක ප්‍රතිපාදන ලබාදීමට හැකිවන පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2024 වර්ෂයේ දී ද වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් උක්ත කාර්යයන් සඳහා රු. බිලියන 220 ක් වෙන්ව තිබූ අතර, 2024 වර්ෂයේ දී විවිධ වියදම් ඒකක සඳහා රු. බිලියන 178 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී ඇත.

2023 අංක 34 දරන විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන සම්බන්ධව වාර්තා වරින්වර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයට අදාලව මෙවැනි වාර්තා 11 ක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ඊට අමතරව ලබා දී ඇති එවැනි අතිරේක ප්‍රතිපාදන ලබාදීම් පිළිබඳ තොරතුරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ ද ඉදිරිපත් කරන ලදී.

### 2.2.7 රජයේ වියදම

ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව 2024 වර්ෂය තුළ සමස්ත රජයේ වියදම රු. බිලියන 10,806ක් ලෙස වාර්තා වී ඇති අතර 2023 රු. බිලියන 10,674ක් වූ අගය හා සැසඳීමේ දී සියයට 78.3ක් එනම් නාමික අගය සැලකූ විට රු බිලියන 132ක වැඩිවීමකි.

රජයේ මුළු වියදමින් සියයට 49.7ක් එනම් රු. බිලියන 5,370ක් පුනරාවර්තන වියදම් වේ. එය 2023 වර්ෂයේ දී මුළු පුනරාවර්තන වියදම වූ රු. බිලියන 4,729 හා සැසඳීමේ දී 2024 වර්ෂය තුළ සියයට 13.5 ක වැඩිවීමකි. 2024 වර්ෂයේ මූලධන වියදම රු. බිලියන 817.09 අතර එය 2023 වර්ෂයේ මූලධන වියදම වූ රු. බිලියන 932.74 හා සැසඳීමේ දී සියයට 12.4 ක අඩු වීමකි.

එබැවින්, 2023 වර්ෂයේ දී සියයට 64 ක් ව පැවති රජයේ මූලධන වියදම්වල උපයෝජන අනුපාතය 2024 දී තව දුරටත් දුර්වල වී සියයට 54 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

2024 වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් සඳහා වියදම රු. බිලියන 4,618 ක්වන අතර එය 2023 වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් සඳහා වියදම වූ රු. බිලියන 5,012 හා සැසඳීමේ දී සියයට 7.8 ක අඩු වීමකි.

2.4.3 වගුව : **වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

| | රුපියල් බිලියන | පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | **5,370.51** | **100** | **49.70** |
| මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි | 722.52 | 13.45 | 6.69 |
| ගමන් වියදම් | 8.72 | 0.16 | 0.08 |
| සැපයුම් | 335.33 | 6.24 | 3.10 |
| නඩත්තු වියදම | 13.49 | 0.25 | 0.12 |
| සේවාවන් | 123.01 | 2.29 | 1.14 |
| මාරුකිරීම් (පළාත් සභා සහ රාජ්‍ය ආයතන වලට මාරුකිරීම් ද ඇතුළත්ව) | 1,477.77 | 27.52 | 13.67 |
| පොළී ගෙවීම් සහ වට්ටම් | 2,689.50 | 50.08 | 24.89 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 0.16 | 0.00 | 0.00 |
| | රුපියල් බිලියන | මූලධන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
| **මුළු මූලධන වියදම** | **817.09** | **100** | **7.56** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 58.22 | 7.12 | 0.54 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 340.39 | 41.66 | 3.15 |
| මූලධන මාරු කිරීම් | 75.95 | 9.30 | 0.70 |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 109.94 | 13.46 | 1.02 |
| හැකියා ප්‍රවර්ධනය | 4.42 | 0.54 | 0.04 |
| වෙනත් මූලධන වියදම් | 228.17 | 27.92 | 2.11 |
| **රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම** | **4,618.83** | | |
| **සමස්ත වියදම** | **10,806.43** | | **100** |

**2024 වර්ෂය සඳහා වියදම් පාලන ක්‍රියාමාර්ග: සාරාංශය සහ අනුමිතීන්**

අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ රාජ්‍ය වියදම් ප්‍රශස්තකරණය සඳහා ගත යුතු දැඩි පියවර පිළිබඳව අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් දක්වා ඇත. මෙම පියවර තුළින් රජයේ මෙහෙයුම්වල විවිධ අංශ තුළ පැවතිය යුතු වගවීම, විචක්ෂණශීලීභාවය සහ කාර්යක්ෂම ලෙස සම්පත් කළමනාකරණය පිළිබඳව අවධාරණය කර ඇත. එහි වැදගත් කරුණු මෙසේ දැක්වේ: ප්‍රධාන වියදම් පාලන ක්‍රියාමාර්ග.

**1. වැටුප් සහ දීමනා:**

- වියදම් පූර්ව අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ සීමා කරන ලදී.
- සුවිශේෂී අවස්ථා හැරුණු විට කිසිදු අතිරේක ප්‍රතිපාදන හෝ F.R. 66 මාරුවීම් සඳහා අවසර දී නොමැත.
- හැකි සෑම විටම නිල කාර්යයන් සඳහා මාර්ගගත රැස්වීම් සහ ක්ෂේත්‍ර නිලධාරීන් මත රඳා පැවතීම  අවධාරණය කරන ලදී.

**2. උපයෝගිතා සහ කාර්යාල සැපයුම්:**

- විදුලිය, ජලය, ඉන්ධන සහ ලිපි ද්‍රව්‍ය සඳහා වන වියදම් අවම කිරීම.
- කඩදාසි භාවිතය අඩු කිරීම සඳහා විද්‍යුත් සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම.
- රජයේ අරමුදල්වලින් දිනපොත්, දින දර්ශන සහ සුබපැතුම් පත් මුද්‍රණය කිරීම අත්හිටුවීම.

**3. වාහන ඇණිය කළමනාකරණය කිරීම:**

- සංචිත වාහන භාවිතය සීමා කරමින් ඉන්ධන හා නඩත්තු වියදම් දැඩිව පාලනය කිරීම.
- නිල වාහන පහසුකම් සඳහා  හිමිකම් ඇති නිලධාරීන් හට ප්‍රවාහන දීමනා ලබාගන්නා ලෙස උනන්දු කිරීම.
- රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීම අත්හිටුවීම.
- භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මාසික කුලී පදනම මත හෝ මෙහෙයුම් කල්බදු පදනම මත වාහන ප්‍රසම්පාදනය නතර කිරීම.

**4. පුහුණු හා විදේශ සංචාර:**

- අනිවාර්ය පුහුණු සඳහා දේශීය රාජ්‍ය ආයතන වෙත නිලධාරීන් යොමු කිරීම.
- විදේශ සංචාර, විශේෂයෙන් දේශීය අරමුදලින් ක්‍රියාත්මක වන අවස්ථාවන්හිදී සීමා කර ඇත.
- අනිවාර්ය පුහුණුවීම් හැර වෙනත් පුහුණු හෝ බාහිර පුහුණු සඳහා රාජ්‍ය අරමුදල් භාවිතය නැවැත්වීම.
- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.03.20 දිනැති MF/06/23/50/2023 දරන ලිපිය ප්‍රකාරව, විදේශ සංචාරවලදී රාජ්‍ය නිලධාරීන් සඳහා ගෙවිය යුතු දීමනාවල අවකරණය කළ අනුපාත පවත්වා ගැනීම.

**5. ඉදිකිරීම් සහ කුලියට ගැනීම්:**

- නව ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ නොකිරීම සහ අර්ධ වශයෙන් ඉදිකරන ලද ඉදිකිරීම් සතුටුදායක මට්ටමක් දක්වා නිම කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව රජයේ අවශ්‍යතා සඳහා ගොඩනැගිලි කුලියට නොගැනීම සහ පවතින ගොඩනැගිලි ප්‍රශස්ත ලෙස භාවිත කිරීම.

**6. සුබසාධන වියදම්**

- ඉලක්කගත ප්‍රතිලාභීන් හට ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වීම සඳහා පවතින සුභසාධන වැඩසටහන් සමාලෝචනය කිරීම.
- ආයතනික මට්ටමින් තීරණ ගැනීම මගින් සහනාධාර වැඩසටහන් හෝ සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක  නොකිරීම.
- විවිධ ද්‍රව්‍ය, භාණ්ඩ, මූල්‍යාධාර සහ උපකරණ බෙදා නොහැරීම.

**7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම:**

- හිඟ බිල්පත් ගෙවීම සහ ආර්ථික වර්ධනයට දායක වන ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වය දීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත අනුමැතියකින් තොරව ඉඩම් හෝ වෙනත් වත්කම් අත්පත් කර නොගැනීම.

**8. රජය සතු ව්‍යවසායන් සහ මණ්ඩල:**

- ආයතනයේ ව්‍යවස්ථාපිත අරමුණු වලින් බැහැර වන ක්‍රියාකාරකම් සඳහා වන වියදම් සීමා කිරීම.
- ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් කළමනාකරණය කිරීම සහ භාවිතයට නොගත් මුදල් අදාළ වැයවිෂය අධිකාරය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නැවත යොමු කිරීම.

- උපයෝජනය නොකරන ලද මුදල් භාණ්ඩාගාරය වෙත ආපසු ලබා දිය යුතු අතර, නිශ්චිතව බලය නොලත් සියලුම ලැබීම් ඒකාබද්ධ අරමුදලේ රඳවා ගැනීම සඳහා බැර කිරීම.
- නිසි අනුමැතියකින් තොරව රක්ෂණ යෝජනා ක්‍රම, සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීම සහ රජයේ අරමුදල් භාවිත කරමින් වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය නොකිරීම.
- ආයතනවල වැටුප් තීරණය කිරීමේදී සාමාන්‍ය වැටුප් ප්‍රතිපත්තිවලින් බැහැර නොවීම.

**9. පොදු මාර්ගෝපදේශ**

- වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් සඳහා බැඳීම් ඇති කරගැනීම තහනම් කරන අතර සිදු වන ඕනෑම උල්ලංඝනයක් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පුද්ගලිකව වගකිව යුතුය.
- අදාළ බලධාරීන් විසින් අනුමත කර ඇත්තේ නම් මිස, නව බඳවා ගැනීම් සහ වැටුප් ගැලපීම් අත්හිටුවීම.
- නම් කරන ලද ජාතික උත්සව හැර, සිදුවීම් හෝ උත්සව සඳහා රජයේ අරමුදල් භාවිත කිරීම සීමා කිරීම.

**අනුමිතීන්**

2024 වියදම් පාලනය තුළින්, විශේෂයෙන් ආර්ථික සීමාවන් සැලකිල්ලට ගැනීමේදී, රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යාම සඳහා කේන්ද්‍රීය ප්‍රයත්නයක් පෙන්නුම් කරයි. අත්‍යවශ්‍ය සේවා සහ ප්‍රමුඛතා සංවර්ධන ව්‍යාපෘතිවලට බාධා නොවන බව සහතික කරමින් රාජ්‍ය ආයතන විසින් පිරිවැය ඉතිරි කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම රාමුව මඟින් රජයේ සියලුම කාර්යයන් හරහා කාර්යක්ෂමතාව සහ වගවීම වැඩි දියුණු කිරීම අරමුණු කෙරේ.

## 2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

තෝරාගත් රාජ්‍ය බැංකු හරහා ක්‍රියාත්මක කරනු ලබන දේපල ණය හැර රාජ්‍ය නිලධාරීන් වෙත ලබාදෙන ණය හා අත්තිකාරම් සහ රජය විසින් මෙහෙයවන ඇතැම් වාණිජමය ස්වභාවයේ කටයුතු මෙම අත්තිකාරම් ගිණුම යටතට ඇතුලත් වේ. 2024 වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සහ ණය ලබා දීම සඳහා ගිණුම් 170 ක් සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා ගිණුම් 11ක් ඇතුළුව ගිණුම් 181 ක් සඳහා උපරිම වියදම් සීමාවන්, අවම ලැබීම් සීමාවන්, හර ශේෂයේ උපරිම සීමාවන් හා බැරකම පිළිබඳ උපරිම සීමා පාර්ලිමේන්තුව විසින් පනවා ඇත.

### 2.3.1 උපරිම ලැබීම් සීමාව

ඉහත පරිදි අත්තිකාරම් ගිණුම් 181 සඳහා පනවා ඇති උපරිම වියදම් සීමාව රු. බිලියන 44.907ට සාපේක්ෂව 2024 වර්ෂය සඳහා සත්‍ය වියදම රු. බිලියන 32.22ක් වාර්තා වේ. සමස්ථයක් ලෙස, අපේක්ෂිත උපරිම වියදමින් 72% ක් පමණ සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර ඇත. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීම සඳහා අනුමත ප්‍රතිපාදනවලින් 87%ක් සහ වාණිජ අත්තිකාරම් ගිණුම් සඳහා අනුමත ප්‍රතිපාදන තුලින් 61% ක් පමණ උපයෝජනය කර ඇත. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන විෂය අංක 21302 පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය පිළිබඳ අත්තිකාරම් ගිණුමේ වියදම අපේක්ෂිත පරිදි සිදු නොවිය.

### 2.3.2 අවම ලැබීම් සීමාව

2023 වර්ෂයේ රජයේ අත්තිකාරම් ගිණුම මගින් අපේක්ෂිත අවම ලැබීම් රු. බිලියන 38.907ක් වූ අතර සත්‍ය ලැබීම රු. බිලියන 30.31 පමණ වේ. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සඳහා වන අත්තිකාරම් ගිණුම්වලින් අපේක්ෂිත අවම ලැබීම් ඉලක්කය සපුරා ඇතත්, ඉහත 2.3.1හි වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විෂය අංක 21302 අවම ලැබීම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සමස්ථ අවම ලැබීම් ඉලක්ක සපුරා ගැනිමට නොහැකි වී ඇත.

### 2.3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් “බී” ගිණුම්වල පොලී ආදායම

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සහ ණය ලබාදීම සඳහා 2024 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් 170 ක් පවත්වාගෙන ගොස් ඇති අතර, එම අත්තිකාරම් කටයුතුවලින් පොලී ආදායම ලෙස 2024 වර්ෂය තුල දී රු මිලියන 1,463 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

### 2.3.4 වාණිජ, ගබඩා සහ අනෙකුත් අත්තිකාරම් ගිණුම්වල මූල්‍ය කාර්යසාධනය

වැය ශීර්ෂ 09ක් යටතේ අනෙකුත් අත්තිකාරම් ගිණුම් 11 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් 02 ක් ගබඩා අතිතිකාරම් ගිණුම් ලෙස ද, වෙනත් අත්තිකාරම් ගිණුම් ලෙස ගිණුම් 04 ක් ද ක්‍රියාත්මක වන අතර, ඒවායින් ලාභයක් හෝ අලාභයක් අපේක්ෂා නොකරයි. නිෂ්පාදන හා වාණිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන අත්තිකාරම් ගිණුම් 05 ක් ලාභදායී තත්ත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර, 2024 වර්ෂය සඳහා රු. මිලියන 850 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

### 2.3.5 අත්තිකාරම් සීමා සංශෝධනය

සමාලෝචිත වර්ෂය තුලදී රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේ ගිණුම් 11 ක සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා වන වාණිජ අත්තිකාරම් ගිණුම් 09 ක සීමා සංශෝධන සිදුකර ඇත.

# 3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| අයවැය 2023 රු. | | සටහන | තත්‍ය 2024 රු. | නැවත ගලපන ලද 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | | | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 333,509 | 490,386 | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **333,509** | **490,386** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 630,850,000 | 580,651,000 | ඒසීඒ-3 |
